# FINANCIAL MANAGEMENT (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# <u>මූල්‍ය කළමනාකරණය</u>

ව්‍යාපාර ආයතනයට අවශ්‍ය අරමුදල් යෝග්‍ය මාර්ගවලින් සපයා ගැනීමේ හා එම අරමුදල් ඵලදායි ලෙස ව්‍යාපාර කටයුතුවල ආයෝජනය කරමින් අයිතිකරුවන්ගේ ධනය උපරිම කිරීමේ සියලු කළමනාකරණ කටයුතු මූල්‍ය කළමනාකරණය ලෙස හැඳින්විය හැකි ය.

# <u>මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන කාර්ය</u>

අවශ්‍ය අරමුදල් පිළිබඳ සැලසුම් කිරීම, එම අවශ්‍යතා අනුව අරමුදල් සම්පාදනය කර ගැනීම සහ ඒවා සඵලදායක හා කාර්යක්ෂම ලෙස භාවිත කිරීම මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන කාර්ය වේ.

ClassWork.LK

# <u>මූල්‍ය කළමනාකරණයේ මූලික අරමුණ</u>

මූල්‍ය කළමනාකරණයේ මූලික අරමුණ ව්‍යපාරයේ හිමිකරුවන්ගේ ව්‍යාපාරය හා සබැඳි අගය (ධනය) උපරිම කිරීම යි.

**නිදසුන :**

සමාගමක අගය නැතහොත් වටිනාකම වැඩි වන විට එම සමාගමේ කොටස්වල මිල ඉහළ යයි. සමාගමක හිමිකරුවන් වන්නෝ සාමාන්‍ය කොටස් හිමියෝ ය. ඒ අනුව සාමාන්‍ය කොටස්වල මිල ඉහළ යාමෙන් පෙන්නුම් කරන්නේ අයිතිකරුවන්ගේ ධනය ඉහළ යාමයි. කේවල ස්වාමි ව්‍යාපාරයක අගය නැතහොත් ධනය ඉහළ යාම යනුවෙන් පෙන්විය හැක්නේ එම ව්‍යාපාරය ඉහළ වටිනාකමකට අලෙවි කළ හැකි බව යි.

## වෙනත් අරමුණු

ඉහත මූලික අරමුණට අමතරව පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීමට ද මූල්‍ය කළමනාකරණය මඟින් අපේක්ෂා කෙරේ.

- ලාභය උපරිම කිරීම
- කොටසක ඉපයුම උපරිම කිරීම
- දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීම
- ද්‍රවශීලතාව ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීම

ClassWork.LK

# මූල්‍ය කළමනාකරණයේ දී මූල්‍ය කළමනාකරුවන් විසින් ගනු ලබන වැදගත් තීරණ

මූල්‍ය කළමනාකරණයේ දී මූල්‍ය කළමනාකරුවන් විසින් ගනු ලබන වැදගත් තීරණ වර්ග දෙකකි.

1. මූල්‍යන තීරණ
2. ආයෝජන තීරණ

## මූල්‍යන තීරණ

ජංගම හා ස්ථාවර වත්කම්වල ආයෝජනය කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ තීරණ මූල්‍යන තීරණ වේ. එනම් අවශ්‍ය මූල්‍ය සම්පාදනය කර ගන්නේ කෙසේ ද යන්නයි.

## ආයෝජන තීරණ

අරමුදල් ජංගම හා ස්ථාවර වත්කම්වල යෙදවීම පිළිබඳ ව ගනු ලබන තීරණ ආයෝජන තීරණ වේ. සම්පාදනය කර ගත් අරමුදල් ව්‍යාපාරයේ විවිධ අවශ්‍යතා අතර යොදවන්නේ කෙසේද යන්නයි.

ClassWork.LK

# මූල්‍ය කළමනාකරණ තීරණ ගැලීම් සටහනක් ඇසුරෙන්

- මූල්‍ය කළමනාකරණ තීරණ
  - ආයෝජන තීරණ
    - දිගුකාලීන තීරණ
      - ව්‍යාපාර නවීකරණය පිළිබඳ තීරණ
      - නැවත ස්ථාපනය කිරීම පිළිබඳ තීරණ
      - ව්‍යාපාර වැඩි දියුණු කිරීම පිළිබඳ තීරණ
      - ව්‍යාපාර විවිධාංගීකරණය පිළිබඳ තීරණ
    - කෙටිකාලීන තීරණ
      - මුදල් කළමනාකරණය පිළිබඳ තීරණ
      - ණයගැතයින් පිළිබඳ තීරණ
      - වෙළෙඳ තොග පිළිබඳ තීරණ
      - වෙනත් කෙටිකාලීන ආයෝජන පිළිබඳ තීරණ
  - මූල්‍යන තීරණ
    - දිගුකාලීන තීරණ
      - ප්‍රාග්ධන ව්‍යුහය (ප්‍රාග්ධන මිශ්‍රය) පිළිබඳ තීරණ
        - ණය ප්‍රාග්ධනය ලබාගැනීම පිළිබඳ තීරණ
        - හිමිකම් ප්‍රාග්ධනය රැස් කිරීම පිළිබඳ තීරණ
        - ණය හා හිමිකම් ප්‍රාග්ධන අනුපාතය පිළිබඳ තීරණ
      - ලාභාංශ පිළිබඳ තීරණ
        - රඳවාගැනීම් පිළිබඳ තීරණ
        - ලාභාංශ විභජනය පිළිබඳ තීරණ
    - කෙටිකාලීන තීරණ
      - වෙළෙඳ ණය හිමියන් පිළිබඳ තීරණ
      - බැංකු අයිරා හා අනෙකුත් කෙටිකාලීන බැංකු ණය පිළිබඳ තීරණ
      - ගෙවිය යුතු වියදම් පිළිබඳ තීරණ

ClassWork.LK

# <u>මූල්‍ය කළමනාකරණ තීරණ</u>

මූල්‍ය කළමනාකරණ තීරණ අනුව අරමුදල් සම්පාදනය කර ගන්නා ආකාරය හා ඒවා ආයෝජනය කරන ආකාරය හඳුනා ගත් පසු යෝග්‍ය පරිදි අරමුදල් සපයා ගෙන ඒවා සවලදායි මාර්ගවල ආයෝජනය කළ යුතු ය.

මූල්‍යන තීරණ හා ආයෝජන තීරණ ප්‍රශස්ත ලෙස සිදු වුවහොත් මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන අරමුණ වූ අයිතිකරුවන්ගේ ධනය උපරිම කිරීම මනා ව ඉටු වේ.

මේ සඳහා මූල්‍ය සැලසුම්කරණය හා පාලනය අත්‍යවශ්‍ය වේ. මූල්‍ය සැලසුම්කරණ හා පාලන උපකරණ ලෙස අයවැයකරණය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ යොදා ගනී.

ClassWork.LK

## අයවැයකරණයේ දී යොදා ගන්නා ප්‍රධාන උපකරණ

- මුදල් අයවැය ලේඛනය - Cash Budget
- ප්‍රාග්ධන අයවැයකරණය - Capital Budgeting

## මුදල් අයවැය ලේඛනය

නිශ්චිත අනාගත කාලච්ඡේදයක මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් ඇතුළත් කොට සකස් කරනු ලබන ලේඛනය මුදල් අයවැය ලේඛනය ලෙස හඳුන්වනු ලැබේ. මුදල් අයවැය ලේඛනයක දැකිය හැකි අපේක්ෂිත මුදල් ලැබීම් මාර්ගවලට නිදසුන් පහත දැක්වේ.

ClassWork.LK

## අපේක්ෂිත මුදල් ලැබීම් මාර්ග

**නිදසුන් :**

- අත්පිට විකුණුම්
- ජංගම නොවන වත්කම් විකිණීම
- ණයගැතියන්ගෙන් ලැබීම්

අපේක්ෂිත ගෙවීම්වලට නිදසුන් පහත දැක්වේ.

## අපේක්ෂිත ගෙවීම්

**නිදසුන් :**

- තොග මිලට ගැනීම්
- වැටුප් හා වේතන ගෙවීම්
- ජංගම නොවන වත්කම් මිල දී ගැනීම්

ClassWork.LK

# මුදල් අයවැය ලේඛනයක් පිළියෙළ කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන

- අනාගතයේ දී මුදල් අතිරික්තයක් වේ නම්, එය කල් තබා දැනගත හැකි වීමෙන් එම මුදල් ඵලදායි ව ආයෝජනය කළ හැකි වීම

- අනාගතයේ දී මුදල් ඌනතාවක් වේ නම්, එය ද කල් තබා දැන ගෙන ඊට මුහුණ දීමට සූදානම් විය හැකි වීම

- සත්‍ය මුදල් ක්‍රියාකාරිත්වය හා සැසඳීම මගින් මුදල් පිළිබඳ සැලසුම්කරණය හා පාලනය පහසු වීම

- ව්‍යාපාරික ණය ලබා ගැනීම ව්‍යාපාරයේ අනාගත මූල්‍ය තත්ත්වය තහවුරු කිරීම සඳහා ඉවහල් වීම

ClassWork.LK

## ප්‍රාග්ධන අයවැයකරණය

අනාගතයේ දී ප්‍රතිලාභ ඉපයීමේ අරමුණෙන් ව්‍යාපාර ආයතනයක් සතු ව පවතින වර්තමාන අරමුදල්, වඩා සඵලදායි ලෙස දිගු කාලීන වත්කම්වල හෝ දිගුකාලීන ව්‍යාපෘතිවල හෝ ආයෝජනය කිරීමට සැලසුම් කිරීම ප්‍රාග්ධන අයවැයකරණය වේ.

## දිගු කාලීන ආයෝජන තීරණ

මූල්‍ය කළමනාකරු විසින් ගනු ලබන ප්‍රාග්ධන අයවැයකරණ තීරණ දිගු කාලීන ආයෝජන තීරණ ලෙස සැලකේ.

**නිදසුන් :**

- ව්‍යාපාර කටයුතු වර්ධනය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම.
- නව යන්ත්‍රයක් මිලට ගැනීම.
- ප්‍රචාරණ වැඩ සැලැස්මක් සඳහා වැය කරන දිගු කාලීන වියදම්

ClassWork.LK

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

යම් පසුගිය කාලච්ඡේදයක් තුළ ආයතනයකට සත්‍ය හෝ අපේක්ෂිත හෝ මුදල් ගලා ඒම් සිදු වූ ආකාරය හා එකී මුදල් ගලා යාම් සිදු වූ ආකාරය විශ්ලේෂණය කර දැක්වෙන ප්‍රකාශය මුදල් ප්‍රවාහ ප්‍රකාශය යි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් පසුගිය කාලසීමාවක් සඳහා හෝ අනාගත කාලසීමාවක් සඳහා හෝ පිළියෙළ කළ හැකි ය. ව්‍යාපාරයක මුදල් ප්‍රවාහය නැතහොත් මුදල් ගලා ඒම් හා මුදල් ගලා යාම් සිදු වූ ආකාරය එම ව්‍යාපාරයේ සාර්ථකත්වයට හෝ අසාර්ථකත්වයට හෝ බලපායි. එම නිසා මුදල් ප්‍රවාහය පාලනය කිරීම සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ආයතනයට වැදගත් වේ.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

# FINANCIAL MANAGEMENT (Part-II)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# අරමුදල් අවශ්‍යතා

ව්‍යාපාරයක අරමුදල් අවශ්‍යතා ආකාර දෙකකට වර්ග කර දැක්විය හැකි ය.

1. කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා (කාරක ප්‍රාග්ධන අවශ්‍යතා)
2. දිගු කාලීන මූල්‍ය අවශ්‍යතා (ස්ථාවර ප්‍රාග්ධන අවශ්‍යතා)

**1. කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා (කාරක ප්‍රාග්ධන අවශ්‍යතා)**

එදිනෙදා ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන අරමුදල්

**නිදසුන් :**

- තොග මිලට ගැනීම්
- වැටුප් ගෙවීම්
- දූරකථන, විදුලි ගාස්තු ගෙවීම්

ClassWork.LK

**2. දිගු කාලීන මූල්‍ය අවශ්‍යතා (ස්ථාවර ප්‍රාග්ධන අවශ්‍යතා)**

ව්‍යාපාරය ආරම්භ කිරීමේ දී මෙන් ම ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාමේ දී මූලිකව අවශ්‍ය වන්නා වූ ජංගම නොවන වත්කම් මිල දී ගැනීම සඳහා අවශ්‍ය වන අරමුදල්

**නිදසුන් :**

- ඉඩම් හා ගොඩනැගිලි මිල දී ගැනීමට
- යන්ත්‍රෝපකරණ ලබා ගැනීමට
- රථ වාහන මිල දී ගැනීමට
- කාර්යාලයීය උපකරණ මිල දී ගැනීම්වලට

ClassWork.LK

# අරමුදල් සම්පාදන මාර්ග

අරමුදල් සම්පාදන මාර්ග විවිධ නිර්ණායක ඔස්සේ වර්ගීකරණය කළ හැකි ය.

- මූලාශ්‍රයය අනුව
- සපයා ගන්නා ආකාරය අනුව (අතරමැදියන්ගේ සහභාගිත්වය මත)
- කාලය පදනම් කර ගෙන

ClassWork.LK

# ලබා ගන්නා මූලාශ්‍රය අනුව

## මූල්‍ය සම්පාදන මාර්ග

### අභ්‍යන්තර මාර්ග

**නිදසුන් :**

- රඳවාගත් ලාභ
- ක්ෂය වෙන් කිරීම
- අතිරික්ත වත්කම් විකිණීම
- කාරක ප්‍රාග්ධනය දැඩිව පාලනය කිරීම

### බාහිර මාර්ග

**නිදසුන් :**

- කොටස් නිකුතුව
- බැංකු ණය
- කල් බදු
- බැංකු අයිරා
- උකස්කර
- කුලීපිට ගැනුම්

ClassWork.LK

# සපයා ගන්නා ආකාරය අනුව

(අතරමැදියන්ගේ සහභාගිත්වය අනුව)

මූල්‍ය සම්පාදන මාර්ග

සෘජු මාර්ග

**නිදසුන් :**

- රඳවාගත් ලාභ
- ක්ෂය සඳහා වෙන් කිරීම
- කොටස් නිකුතුව
- ණයකර නිකුතුව
- අතිරික්ත වත්කම් විකිණීම

වක්‍ර මාර්ග

**නිදසුන් :**

- කල් බදු
- වාණිජ පත්‍රිකා
- බැංකු අයිරා
- බැංකු ණය
- සාධ්‍යකරණය

ClassWork.LK

# කාලය අනුව

(කාලය පදනම් කර ගෙන)

මූල්‍ය සම්පාදන මාර්ග

## දිගු කාලීන මූල්‍ය මාර්ග

**නිදසුන් :**

- කොටස් නිකුතුව
- ණයකර නිකුතුව
- කල් බදු
- දිගු කාලීන බැංකු ණය

## කෙටි කාලීන මූල්‍ය මාර්ග

**නිදසුන් :**

- වාණිජ පත්‍රිකා
- බැංකු අයිරා
- ගෙවිය යුතු වියදම්
- වෙළෙඳ ණය

ClassWork.LK

## <u>මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු</u>

- අවශ්‍ය අරමුදල් ප්‍රමාණය
- අරමුදල් අවශ්‍ය වන කාලය (දිගුකාලීන ද, කෙටිකාලීන ද)
- පිරිවැය (අරමුදල් සපයා ගැනීම හා ඒවා නඩත්තු කිරීම)

  **නිදසුන් :**

  - ව්‍යාපෘති වාර්තා සැකසීමේ ගාස්තු
  - වත්කම් සුරැකුම් ලෙස බැඳීමට යන වියදම්
  - නීතිඥ ගාස්තු
  - පොළිය
- ව්‍යාපාර සංවිධානයේ ස්වභාවය (තනි / හවුල් / සීමිත සමාගම්)
- තැබිය යුතු ඇප සුරැකුම් පිළිබඳ තත්ත්වය

ClassWork.LK

- ව්‍යාපාරයේ ප්‍රාග්ධන ව්‍යුහයට වන බලපෑම

- අරමුදල් යොදවන ව්‍යාපෘතියේ ස්වභාවය හා ඉන් අපේක්ෂිත ප්‍රතිලාභ

- ව්‍යාපාරයේ කළමනාකරණයට සිදු වන බලපෑම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

# FINANCIAL MANAGEMENT
# (Part-III)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# ආයෝජන තීරණ

ව්‍යාපාරයක් සතු අරමුදල් ව්‍යාපාරය තුළ හෝ පිටත වත්කම්වල හෝ යෙදවීම ආයෝජනය වන අතර ඒ සඳහා ගන්නා තීරණ ආයෝජන තීරණ ලෙස හැඳින්වේ. ආයෝජන තීරණ පහත ආකාරයෙන් වර්ග කර දැක්විය හැකි ය.

# ආයෝජන තීරණ වර්ගීකරණය

ආයෝජන තීරණ

**කෙටි කාලීන ආයෝජන තීරණ (කාරක ප්‍රාග්ධන තීරණ)**

නිදසුන් :

- මුදල්
- වෙළෙඳ ණයගැතියෝ
- තොග
- කෙටි කාලීන ආයෝජන
- සුරැකුම්පත්

**දිගු කාලීන ආයෝජන තීරණ (ප්‍රාග්ධන ආයෝජන තීරණ)**

නිදසුන් :

- ව්‍යාපාරය ස්ථාපනය කිරීම
- ව්‍යාපාරය නවීකරණය කිරීම හා පුළුල් කිරීම
- ව්‍යාපාරය විවිධාංගීකරණය කිරීම
- ස්ථාවර වත්කම් / දිගුකාලීන සුරැකුම්පත්

ClassWork.LK

# ආයෝජන තීරණ ව්‍යාපාරයේ සාර්ථකත්වයට බලපාන ආකාරය

ආයෝජනයක් කිරීමේ දී නිවැරදි තීරණ ගැනීම ව්‍යාපාරයේ සාර්ථකත්වයට මඟපෙන්වයි. ව්‍යාපාර සාර්ථකත්වය සඳහා ආයෝජන තීරණ වැදගත් වේ.

ව්‍යාපාරයේ සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම, විකල්ප ආයෝජන අවස්ථා හඳුනාගත හැකි වීම, වැඩි ප්‍රතිලාභ සහිත ආයෝජන තෝරා ගැනීම වැනි දෑ ආයෝජන තීරණවලින්සිදුවන නිසා ආයෝජන තීරණ ව්‍යාපාරයේ සාර්ථකත්වයට බලපායි.

Class Work.LK

## ආයතනයක් අරමුදල් ජංගම හා ස්ථාවර වත්කම්වල ආයෝජනය කිරීමේ දී සලකා බලන කරුණු

- ආයෝජනයේ ප්‍රතිලාභය
- ආයතනයේ ප්‍රතිපත්ති
- ආයෝජනයේ අවදානම
- ආයෝජනයේ පිරිවැය
- ද්‍රවශීලතාව
- නීතිමය තත්ත්වය
- පරිසර සාධක
- මෙහෙයුම් ක්‍රියාකාරිත්වයට ඇති කරන බලපෑම
- අවිනිශ්චිතතා

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

# FINANCIAL MANAGEMENT (Part-IV)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# අනුපාත විශ්ලේෂණය

මූල්‍ය අනුපාත ගණනය කරමින් ගිණුම්කරණ ප්‍රකාශ විශ්ලේෂණය කිරීමේ ශිල්ප ක්‍රමය අනුපාත විශ්ලේෂණය ලෙස හඳුන්වයි. ව්‍යාපාරයක ක්‍රියාකාරිත්වය හා මූල්‍ය තත්ත්වය තේරුම් ගැනීම සඳහා මූල්‍ය අනුපාත ප්‍රයෝජනවත් වේ. අනුපාත විශ්ලේෂණය සඳහා යොදා ගනු ලබන්නේ මූල්‍ය ප්‍රකාශවල අඩංගු තොරතුරු ය. මෙහි දී පහත මූල්‍ය ප්‍රකාශ උපයෝගී කර ගනී.

# අනුපාත විශ්ලේෂණය සඳහා යොදා ගනු ලබන මූල්‍ය ප්‍රකාශ

- ආදායම් ප්‍රකාශය (ලාභලාභ ගිණුම)
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ClassWork.LK

# මූල්‍ය අනුපාත වර්ගීකරණය

- ද්‍රවශීලතා අනුපාත - (Liquidity Ratios)
- ලාභදායිත්ව අනුපාත - (Profitability Ratios)
- ක්‍රියාකාරී අනුපාත - (Activity Ratios)
- මූල්‍ය ස්ථාවරත්ව අනුපාත/ තෝලන අනුපාත - (Leverage Ratios)

ClassWork.LK

- පහත දැක්වෙන්නේ සී/ස නවෝද්‍යා සමාගමේ 2017. 12. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙළ කළ ආදායම් ප්‍රකාශය හා එදිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

# සී/ස නවෝදයා සමාගම

# 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

| | රු. | රු. |
|---|---|---|
| විකුණුම් | | 500 000 |
| ආරම්භක තොගය | 20 000 | |
| ගැනුම් | 310 000 | |
| ගෙන ඒමේ කුලී | 10 000 | |
| | 340 000 | |
| අවසන් තොගය | (40 000) | |
| විකුණුම් පිරිවැය | | (300 000) |
| දළ ලාභය | | 200 000 |
| වෙනත් ආදායම් | | 20 000 |
| මුළු ආදායම | | 220 000 |
| පරිපාලන වියදම් | 20 000 | |
| බෙදා හැරීමේ වියදම් | 32 000 | |
| වෙනත් වියදම් | 8 000 | |
| මූල්‍ය වියදම් | 15 000 | (75 000) |
| බදු පෙර ශුද්ධ ලාභය | | 145 000 |
| ආදායම් බදු | | (45 000) |
| බදු පසු ශුද්ධ ලාභය | | 100 000 |

ClassWork.LK

## සී/ස නවෝද්‍යා සමාගම

## 2017.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | පිරිවැය<br>රු. | සමුච්චිත ක්ෂය<br>රු. | ධාරණ අගය<br>රු. |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| ගොඩනැගිලි | 300 000 | 100 000 | 200 000 |
| යන්ත්‍ර හා පිරියත | 250 000 | 50 000 | 200 000 |
| | 550 000 | 150 000 | 400 000 |
| කීර්ති නාමය | | | 50 000 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | | 40 000 | |
| ණයගැතියෝ | | 20 000 | |
| කලින් ගෙවූ වියදම් | | 10 000 | |
| මුදල් ශේෂය | | 30 000 | 100 000 |
| මුළු වත්කම් | | | 550 000 |
| **කොටස් ප්‍රාග්ධනය** | | | |
| සාමාන්‍ය කොටස් ප්‍රකාශිත ප්‍රාග්ධනය | | 150 000 | |
| වරණීය කොටස් ප්‍රකාශිත | | 120 000 | 270 000 |
| **සංචිත** | | | |
| ඉ/ගෙ ලාභාලාභ ශේෂය | | | 150 000 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| බැංකු ණය | | 30 000 | |
| 8% ණයකර | | 50 000 | 80 000 |
| **ජංගම වගකීම්** | | | |
| ණයහිමියෝ | | 20 000 | |
| ගෙවිය යුතු පොළී | | 10 000 | |
| උපචිත වියදම් | | 4 000 | |
| ගෙවිය යුතු බදු | | 16 000 | 50 000 |
| හිමිකම් හා වගකීම් | | | 550 000 |

ClassWork.LK

## මූල්‍ය අනුපාත පහත දැක්වෙන ආකාරයට වර්ග කළ හැකි ය

- ද්‍රවශීලතා අනුපාත - Liquidity Ratio
- ලාභදායිත්ව අනුපාත - Profitability Ratio
- ක්‍රියාකාරී අනුපාත - Activity Ratio
- තෝලන අනුපාත - Lverage Ratio/Gearing Ratio

## ද්‍රවශීලතා අනුපාත (Liquidity Ratio)

කෙටි කාලීන මූල්‍ය බැඳීම්වලට / වගකීම්වලට මුහුණ දීමට ඇති හැකියාව පෙන්නුම් කරන අනුපාත ද්‍රවශීලතා අනුපාත වේ. එමෙන් ම ව්‍යාපාරයක කෙටි කාලීන නුබුන්වත් බව හඳුනා ගැනීමට මෙම අනුපාත භාවිත කෙරේ.

ClassWork.LK

# <u>ද්‍රවශීලතා අනුපාත</u>

- ජංගම අනුපාතය - Current Ratio
- ක්ෂණික අනුපාතය - Quick Ratio

## ජංගම අනුපාතය (Current Ratio)

ජංගම වත්කම් හා ජංගම වගකීම් අතර සම්බන්ධතා පෙන්නුම් කරන අනුපාතය ජංගම අනුපාතය යි.

ජංගම අනුපාතය

$$\text{ජංගම අනුපාතය} = \frac{\text{ජංගම වත්කම්}}{\text{ජංගම වගකීම්}}$$

$$\text{නවෝදා සමාගමේ ජංගම අනුපාතය} = \frac{100,000}{50,000}$$

$$= \underline{\underline{2}}$$

ClassWork.LK

- ජංගම වගකීම්වලින් දෙගුණයක් ජංගම වත්කම් පැවතීම නැතහොත් ජංගම අනුපාතය දෙකක් ලෙස පැවතීම යෝග්‍ය බව සාමාන්‍යයෙන් පිළිගැනේ. එහෙත් ආයතනයේ ස්වභාවය අනුව මෙය වෙනස් වේ.

## ක්ෂණික අනුපාතය (Quick Ratio)

ජංගම වගකීම් හා ද්‍රවශීල වත්කම් අතර ඇති සම්බන්ධතාව පෙන්නුම් කරන අනුපාතය ක්ෂණික අනුපාතයයි. ජංගම වත්කම් ඉතා අඩු ද්‍රවශීලතාවයක් ඇති වත්කම් මේ අනුපාතය ගණනයේදී ඉවත් කෙරේ.

$$\text{ක්ෂණික අනුපාතය} = \frac{\text{ද්‍රවශීල වත්කම්}}{\text{ජංගම වගකීම්}}$$

ClassWork.LK

$$\text{ද්‍රවශීල වත්කම්} = \text{ජංගම වත්කම්} - \left( \text{අවසාන තොගය} + \text{කලින් ගෙවූ වියදම්} \right)$$

$$\text{නවෝදා සමාගමේ ක්ෂණික අනුපාතය} = \frac{100{,}000 - (40{,}000 + 10{,}000)}{50{,}000}$$

$$= \frac{50{,}000}{50{,}000}$$

$$= \underline{\underline{1}}$$

- ජංගම වගකීම් හා සමාන ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් පැවතීම හෙවත් ක්ෂණික අනුපාතයේ 01ක් ව පැවතීම යෝග්‍ය බව සාමාන්‍යයෙන් පිළිගැනේ.

ClassWork.LK

# ලාභදායිත්ව අනුපාත

වත්කම්, කොටස් ආයෝජනය හා විකුණුම් මත ව්‍යාපාරය උපයන ලාභය කොපමණ ද යන්න පෙන්නුම් කරන අනුපාත ලාභදායිත්ව අනුපාත වේ.

ලාභදායිත්ව අනුපාත කීපයක් පහත දැක්වේ.

- දළ ලාභ අනුපාතය - Gross Profit Ratio
- ශුද්ධ ලාභ අනුපාතය - Net Profit Ratio
- ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය - Return on Investment
- හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය - Return on Equity

ClassWork.LK

# දළ ලාභ අනුපාතය

විකුණුම්වලට අනුව දළ ලාභයේ ප්‍රමාණය, ප්‍රතිශතයක් ලෙස මෙම අනුපාතයෙන් පෙන්වයි.

$$\text{ක්ෂණික අනුපාතය} = \frac{\text{දළ ලාභය}}{\text{විකුණුම්}} \times 100$$

$$\text{නවෝදා සමාගමේ ක්ෂණික අනුපාතය} = \frac{200\,000}{500\,000} \times 100$$

$$= \underline{\underline{40\%}}$$

❖ මෙය ප්‍රතිශතයක් ලෙස ඉදිරිපත් කරන අතර ගණනය කිරීමෙන් ලැබෙන පිළිතුර වැඩි වන තරමට ව්‍යාපාරයට හිතකර යි. මෙමගින් ව්‍යාපාරයේ මිල ප්‍රතිපත්ති පෙන්නුම් කෙරේ.

ClassWork.LK

# ශුද්ධ ලාභ අනුපාතය

ව්‍යාපාරයේ ශුද්ධ ලාභය, විකුණුම්වල, ප්‍රතිශතයක් ලෙස මෙම අනුපාතයෙන් පෙන්නුම් කරයි. ශුද්ධ ලාභය ලෙස සැලකිල්ලට ගනු ලබන්නේ බදු පෙර ශුද්ධ ලාභය යි.

$$\text{ශුද්ධ ලාභ අනුපාතය} = \frac{\text{බදු පෙර ශුද්ධ ලාභය}}{\text{විකුණුම්}}$$

මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාව මැනීම සඳහා ශුද්ධ ලාභ අනුපාතය යොදා ගැනේ.

ClassWork.LK

# ආයෝජනය මත ප්‍රතිලාභ අනුපාතය

$$\text{ආයෝජනය මත ප්‍රතිලාභ අනුපාතය} = \frac{\text{බදු පසු ශුද්ධ + පොලිය ලාභය}}{\text{යෙදූ ප්‍රාග්ධනය /මුළු වත්කම}} \times 100$$

$$\text{නවෝදා සමාගමේ ආයෝජනය මත ප්‍රතිලාභ අනුපාතය} = \frac{100\ 000 + 15000}{550\ 000} \times 100$$

$$= \underline{20.9\ \%}$$

ClassWork.LK

## **හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතිකය / අයිතිකරුවන්ගේ අනුපාතය (Return on Equity)**

$$\text{හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතිකය} = \frac{\text{බදු පසු ශුද්ධ ලාභය} - \text{වරණීය ලාභය}}{\text{හිමිකම් ප්‍රාග්ධනය}} \times 100$$

$$\text{නවෝදා සමාගමේ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතිකය} = \frac{100{,}000 - 0}{150{,}000 + 150{,}000} \times 100$$

$$= \underline{33.3\ \%}$$

ClassWork.LK

# ක්‍රියාකාරී අනුපාත / මෙහෙයුම් කාර්යක්ෂමතා අනුපාත

වත්කම්වල ආයෝජනය හා ඒවායින් ජනිත කරන ඉපයීම් අතර ඇති සම්බන්ධතාව පෙන්වන අනුපාත ක්‍රියාකාරී අනුපාත වේ.

ක්‍රියාකාරී අනුපාත කීපයක් පහත දැක්වේ.

- තොග පිරිවැටුම් අනුපාත - Inventory Turnover Ratio
- ණයගැති පිරිවැටුම් අනුපාත - Debtors Turnover Ratio
- මුළු වත්කම් පිරිවැටුම් අනුපාත - Total Assets Turnover Ratio

$$\text{හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතිකය} = \frac{\text{බදු පසු ශුද්ධ ලාභය} - \text{වරණීය ලාභය}}{\text{හිමිකම් ප්‍රාග්ධනය}}$$

ClassWork.LK

# <u>තොග පිරිවැටුම් අනුපාතය</u>

තොගය, විකුණුම් බවට පත්වීමේ ශීඝ්‍රතාව ප්‍රමාණාත්මක ව දැක්වෙන අනුපාතය තොග පිරිවැටුම් අනුපාතයයි.

$$\text{තොග පිරිවැටුම් අනුපාතය} = \frac{\text{විකුණූ භාණ්ඩවල පිරිවැය}}{\text{සාමාන්‍ය තොගය}}$$

$$\text{සාමාන්‍ය තොගය} = \frac{\text{ආරම්භක තොගය} + \text{අවසාන තොගය}}{2}$$

ClassWork.LK

# ණයගැති පිරිවැටුම් අනුපාතය

ව්‍යාපාරය කොතරම් කාර්යක්ෂම ලෙස ණයගැතියන්ගෙන් මුදල් එකතු කරන්නේ ද යන්න මෙම අනුපාතයෙන් පෙන්නුම් කෙරේ.

$$\text{ණයගැති පිරිවැටුම් අනුපාතය} = \frac{\text{ණයට විකුණුම්}}{\text{සාමාන්‍ය ණයගැතියෝ}}$$

$$\text{සාමාන්‍ය ණයගැතියෝ} = \frac{\text{ආරම්භක ණයගැතියෝ} + \text{අවසාන ණයගැතියෝ}}{2}$$

ClassWork.LK

ණයගැති පිරිවැටුම් අනුපාතය $= \dfrac{200,000}{20,000}$

$= \underline{\underline{10}}$

## <u>මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය</u>

ව්‍යාපාරයේ මුළු වත්කම් හා විකුණුම් අතර ඇති සම්බන්ධතාව පෙන්නුම් කෙරෙන අනුපාතය මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය යි. එනම් ව්‍යාපාරය සතු මුළු වත්කම් කොතෙක් දුරට කාර්යක්ෂම ව යොදා ගෙන තිබේ ද යන්න මෙයින් පෙන්වයි.

නවෝදා සමාගමේ මුළුවත්කම් පිරිවැටුම් අනුපාතිකය $= \dfrac{500,000}{550,000}$

$= \underline{\underline{0.9}}$

ClassWork.LK

# තෝලන අනුපාත / මූල්‍ය ස්ථාවරත්ව අනුපාත

ආයතනයේ අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනය හා ණය ප්‍රාග්ධනය අතර ඇති සම්බන්ධතාව පෙන්නුම් කරන අනුපාත තෝලන අනුපාත වේ.

තෝලන අනුපාත කීපයක් පහත දැක්වේ.

- ණය අනුපාතය - (Debt Ratio)
- ණය හිමිකාරිත්ව අනුපාතය / ණය ස්කන්ධ අනුපාතය - (Debt - Equity Ratio)
- පොළී ආවරණ අනුපාතය - (Interest Coverage Ratio)

ClassWork.LK

## ණය අනුපාතය

ආයතනයේ මුළු ප්‍රාග්ධනයෙන් කොපමණ ප්‍රමාණයක් ණය ප්‍රාග්ධනය සමන්විත වේ ද යන්න මෙම අනුපාතයෙන් පෙන්නුම් කෙරේ.

$$\text{ණය අනුපාතය} = \frac{\text{ස්ථිර පොලියක් ගෙවන ප්‍රාග්ධනය}}{\text{මුළු ප්‍රාග්ධනය}} \times 100$$

$$\text{නවෝදා සමාගමේ ණය ප්‍රාග්ධනය} = \frac{120,000 + 30,000 + 50,000}{500,000} \times 100$$

$$= \underline{\underline{40\%}}$$

ClassWork.LK

# ණය හිමිකාරිත්ව අනුපාතය

ණය හිමිකාරිත්ව අනුපාතය = ස්ථීර පොලියක් ගෙවන ප්‍රාග්ධනය / හිමිකම් ප්‍රාග්ධනය

හිමිකම් ප්‍රාග්ධනය = සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය + සංචිත

ස්ථීර පොලියක් ගෙවන ප්‍රාග්ධනය = වරණීය කොටස් ප්‍රාග්ධනය + ණයකර + දිගු කාලීන ණය

ClassWork.LK

නවෝදා ණය හිමිකාරිත්ව අනුපාතය $= \dfrac{200,000}{300,000}$

$= \underline{\underline{0.6}}$

## පොලී ආවරණ අනුපාතය

ව්‍යාපාරයේ ඉපැයුම්වලින් පොලිය කී වාරයක් ගෙවිය හැකි ද යන්න මෙම අනුපාතයෙන් පෙන්නුම් කෙරේ.

| |
|---|
| පොලී ආවරණ අනුපාතය $= \dfrac{\text{පොලී හා බදුවලට පෙර ලාභය}}{\text{පොලිය}}$ |

නවෝදා සමාගමේ පොලී ආවරණ අනුපාතය $= \dfrac{160,000}{15,000}$

$= \underline{\underline{10.6}}$

ClassWork.LK

2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගම් දෙකක ආදායම් ප්‍රකාශ දෙකකි.

| | රු. විදුර සමාගම | රු. අවිදුර සමාගම |
|---|---|---|
| විකුණුම් | 300 000 | 500 000 |
| විකුණුම් පිරිවැය | (200 000) | (300 000) |
| දළ ලාභය | 100 000 | 200 000 |
| වෙනත් ආදායම් | 15 000 | 20 000 |
| | 115 000 | 220 000 |
| බෙදාහැරීමේ වියදම් | (13 000) | (15 000) |
| පරිපාලන වියදම් | (16 000) | (18 000) |
| වෙනත් වියදම් | (10 000) | (20 000) |
| මූල්‍ය වියදම් | (6 000) | (17 000) |
| බදු පෙර ලාභය | 75 000 | 150 000 |
| බදු | (20 000) | (30 000) |
| කාලච්ඡේදයේ ලාභය | 55 000 | 120 000 |
| අත්පිට විකුණුම් | 40% | 50% |
| වාර්ෂික ක්ෂය රු. | 9 000 | 10 000 |
| ආරම්භක තොගය | 20 000 | 30 000 |
| අවසාන තොගය | 30 000 | 40 000 |

ClassWork.LK

2017.03.31 මූල්‍ය තත්ත්ව ප්‍රකාශයපහත දැක්වෙන්නේ

| | විදුර සමාගම රු. | අවිදුර සමාගම රු. |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපළ පිරියත හා උපකරණ | 270 000 | 30 000 |
| රථ වාහන | 50 000 | 100 000 |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 30 000 | 40 000 |
| ණයගැතියෝ | 20 000 | 25 000 |
| කලින් ගෙවුම් | 10 000 | 15 000 |
| මුදල් තැන්පතු | 20 000 | 30 000 |
| | 400 000 | 510 000 |
| **ප්‍රාග්ධනය හා තැන්පතු** | | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 140 000 | 200 000 |
| වරණීය කොටස් ප්‍රාග්ධනය | 100 000 | 150 000 |
| රඳවාගත් ඉපැයුම | 60 000 | 70 000 |
| පොදු සංචිතය | -- | 20 000 |
| **ජංගම නොවන වගකීම්** | | |
| බැංකු ණය | 20 000 | 30 000 |
| 8% ණයකර | 40 000 | -- |
| **ජංගම වගකීම්** | | |
| ණයහිමියෝ | 17 000 | 20 000 |
| උපචිත වියදම් | 10 000 | 5 000 |
| ගෙවිය යුතු බදු | 13 000 | 15 000 |
| | 400 000 | 510 000 |

ClassWork.LK

සීමාසහිත ළහිරු සමාගමේ 2016.06.30 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාරාංශගත ආදායම් ප්‍රකාශය ක් හා මුල්‍ය තත්ත්ව ප්‍රකාශයේ තොරතුරු කීපයකි.

## ආදායම් ප්‍රකාශය

| | | |
|---|---|---|
| විකුණුම් | | 640 000 |
| විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොගය | 60 000 | |
| ගැනුම් | 340 000 | |
| අවසාන තොගය | (80 000) | (320 000) |
| දළ ලාභය | | 320 000 |
| බෙදා හැරීමේ වියදම් | 60 000 | |
| පරිපාලන වියදම් | 34 000 | |
| මූල්‍ය හා වෙනත් | 25 000 | |
| අනෙකුත් වියදම් | 11 000 | (130 000) |
| බදු පෙර ලාභය | | 190 000 |
| අඩු කළ බදු | | (70 000) |
| බදු පසු ශුද්ධ ලාභය | | 120 000 |

❖ විකුණුම්වලින් 80%ක් අත්පිට විකුණුම් වේ.

ClassWork.LK

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | | |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | 800 000 |
| ආයෝජන | | 50 000 |
| **ජංගම වත්කම්** | | |
| ණයගැතියෝ | 20 000 | |
| තොගය | 80 000 | |
| ඉදිරියට ගෙවීම් | 10 000 | |
| මුදල් | 40 000 | 150 000 |
| | | 1 000 000 |
| සා. කො. ප්‍රාග්ධනය | 560 000 | |
| වරණීය කොටස් ප්‍රාග්ධනය | 220 000 | |
| ලාභාලාභ ගිණුම් ශේෂය | 120 000 | 900 000 |
| 10% බැංකු ණය | | 50 000 |
| ජංගම වගකීම් | | |
| ණය හිමියෝ | 45 000 | |
| උපචිත වියදම් | 5 000 | 50 000 |
| | | 1 000 000 |

ClassWork.LK

1. පහත සඳහන් අනුපාත ගණනය කර පෙන්වන්න.

- ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය
- දළ ලාභ අනුපාතය හා ශුද්ධ ලාභ අනුපාතය
- තොග පිරිවැටුම් අනුපාතය හා මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය
- ණය අනුපාතය හා ණය හිමිකාරිත්ව අනුපාතය

2. ඔබ ගණනය කළ එක් එක් අනුපාත ඇසුරෙන්

- ආයතනයේ ද්‍රවශීලතා අනුපාතය
- ලාභදායිත්ව
- පැවැත්ම
- ආදිය පිළිබඳ ව විග්‍රහයක යෙදෙන්න.
- මූල්‍ය අනුපාත විශ්ලේෂණයේ වැදගත්කම හා සීමාවන් දක්වන්න

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

# FINACIAL MANAGEMENT (Part-V)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# <u>මූල්‍ය පද්ධතිය</u>

ආර්ථිකයක මූල්‍ය තීරණ ක්‍රියාත්මක කිරීමේ නිරතව සිටින

- මූල්‍ය වෙළෙඳ පොළ
- මූල්‍ය ආයතන
- මූල්‍ය උපකරණ
- මූල්‍ය යටිතල පහසුකම්
- මධ්‍ය බැංකුව


ආදියෙන් සමන්විත පද්ධතිය මූල්‍ය පද්ධතිය වේ.

ClassWork.LK

## මූල්‍ය අතරමැදිකරණය

මූල්‍ය පද්ධතිය තුළ සිදු වන ප්‍රධාන හා වැදගත් කාර්ය වන්නේ ''මූල්‍ය අතරමැදිකරණය යි''. අරමුදල් අතිරික්තයක් ඇති ඒකක හා අරමුදල් අරමුදල් හිගයක් ඇති ඒකක සම්බන්ධ කෙරෙන යාන්ත්‍රණය.

## මූල්‍ය පද්ධතියක සංයුතිය




ClassWork.LK

❖ රටක මූල්‍ය වෙළෙඳ පොළෙහි ක්‍රියාත්මක වන බැංකු හා බැංකු නොවන සියලු ම ආයතන මූල්‍ය ආයතන වේ. ශ්‍රී ලංකාවේ මධ්‍ය බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුව.

## ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍යායතනත වර්ග කර ඇති ආකාරය

### 01. බැංකු අංශය

- ශ්‍රී ලංකා මහ බැංකුව
- බලපත්‍ර ලාභී වාණිජ බැංකු
- බලපත්‍ර ලාභී විශේෂිත බැංකු

ClassWork.LK

## 02. තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන

- බලපත්‍රලාභී මුදල් සමාගම්
- සමූපකාර ග්‍රාමීය බැංකු
- සකසුරුවම් හා ණය දෙන සමූපකාර සමිති

## 03. අනෙකුත් විශේෂිත මූල්‍යායතන

- විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්
- ප්‍රාථමික අලෙවිකරුවෝ
- කොටස් තැරැව්කාර සමාගම්
- ඒකක භාර /ඒකක භාර කළමනාකාර සමාගම්
- වෙළෙඳ පොළ අතරමැදියෝ
- ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්
- ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන

ClassWork.LK

# 04. ගිවිසුම්ගත ඉතිරිකිරීමේ ආයතන

- රක්ෂණ සමාගම්
- සේවක අර්ථසාධක අරමුදල
- සේවක භාරකාර අරමුදල
- අනුමත පෞද්ගලික අර්ථසාධක අරමුදල
- රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල

ClassWork.LK

## ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳ පොළෙහි ක්‍රියාත්මක වන මූල්‍ය උපකරණ ලෙස

- භාණ්ඩාගාර බිල්පත්
- භාණ්ඩාගාර බැඳුම්කර
- සාමාන්‍ය කොටස්
- වරණීය කොටස්
- වාණිජ පත්‍රිකා
- තැන්පතු සහතික
- සංගමික ණයකර ආදිය දැක්විය හැකි ය.

(15.6 නිපුණතාව තුළ විස්තරාත්මක සාකච්ඡා කර ඇත )

ClassWork.LK

## මූල්‍ය යටිතල පහසුකම්

රටක මූල්‍ය ක්‍රමයේ සංවිධිත ක්‍රියාකාරිත්වය හා ස්ථායිතාව තහවුරු කිරීම සඳහා ආධාර වන ගෙවීම් හා පියවීම් පද්ධති මූල්‍ය යටිතල පහසුකම් ලෙස හැඳින්වේ.

**නිදසුන් :**

1. තත්කාලීන දළ පියවීම් පද්ධතිය
   (Real Time Gross Settlement System (RTGS )

2. ඡායාගත පිළිබිඹු චෙක්පත් නිෂ්කාශන පද්ධතිය
   (Image Cheque Clearing / Cheque Truncation System (CTS)

3. නිර්ලේඛන සුරැකුම්පත් පියවීම් පද්ධතිය
   (Scriptless Securities Settlement System (SSSS)

4. ජගත් අන්තර් බැංකු සන්නිවේදන සංගමය
   (Society for World wide Interbank Financial Telecommunication (SWIFT )

ClassWork LK

# රටක මූල්‍ය පද්ධතිය ගැලීම් සටහනක් මඟින්

## මූල්‍ය පද්ධතිය

### මූල්‍යායතන

- බැංකු අංශය
  - බලපත්‍ර ලාභී වාණිජ බැංකු
  - බලපත්‍ර ලාභී විශේෂිත බැංකු
- තැන්පතු භාරගන්නා අනෙකුත් මූල්‍යායතන
  - බලපත්‍ර ලාභී මුදල් සමාගම්
  - සමුපකාර ග්‍රාමීය බැංකු
- අනෙකුත් විශේෂිත මූල්‍යායතන
  - විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්
  - කොටස් තැරැව්කාර සමාගම්
  - ව්‍යාවසායක ප්‍රාග්ධන සමාගම්
- ගිවිසුම් ගත ඉතිරි කිරීම් ආයතන
  - රක්ෂණ සමාගම්
  - සේවක අර්ථසාධක අරමුදල
  - සේවක භාරකාර අරමුදල

### මූල්‍ය උපකරණ

- භාණ්ඩාගාර බිල්පත්
- භාණ්ඩාගාර බැඳුම්කර
- සාමාන්‍ය කොටස්
- වරණීය කොටස්
- වාණිජ පත්‍රිකා
- තැන්පතු සහතික
- සාංගමික බැඳුම්කර

### මූල්‍ය වෙළෙඳපොළ

- මුදල් වෙළෙඳ පොළ
  - අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳ පොළ
  - දේශීය විදේශීය විනිමය වෙළෙඳ පොළ
  - භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළ
  - වණිජ පත්‍රිකා වෙළෙඳ පොළ
- ප්‍රාග්ධන වෙළෙඳ පොළ
  - භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳ පොළ
  - සාංගමික බැඳුම්කර වෙළෙඳ පොළ
  - කොටස් වෙළෙඳ පොළ

### මූල්‍ය යටිතල පහසුකම්

- තත්කාලීන දළ පියවීම් පද්ධතිය<br>නිර්ලේඛන සුරැකුම්පත් පියවීම් පද්ධතිය
- ඡායාගත පිළිබිඹු චෙක්පත් නිෂ්කාශන ක්‍රමය
- ජගත් අන්තර් බැංකු මූල්‍ය සන්නිවේදන සංගමය

### මධ්‍යම බැංකුව

Class Work.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

# FINANCIAL MANAGEMENT
# (Part-VI)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

## මූල්‍ය වෙළෙඳ පොළ

අරමුදල් සපයන්නන් හා අරමුදල් ඉලල්ම් කරන්නන් සම්බන්ධ කිරීම සඳහා පවත්නා ස්ථානයක් හෝ අවකාශයක් මූල්‍ය වෙළෙඳ පළක් ලෙස හැඳින්වේ. මූල්‍ය වෙළෙඳ පොළෙහි මූල්‍ය වත්කම් මිල දී ගැනීම හා විකිණීම සිදු කරයි.

## මූල්‍ය වෙළෙඳ පොළ සංයුතිය

මූල්‍ය වෙළෙඳ පොළේ සංයුතිය පහත දැක්වෙන වෙළෙඳ පොළවලින් සමන්විත වේ.

- අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳ පොළ
- දේශීය විදේශීය විනිමය වෙළෙඳ පොළ
- රජයේ සුරැකුම්පත් වෙළෙඳ පොළ
    - භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළ
    - භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳ පොළ

ClassWork.LK

- සාංගමික ණය සුරැකුම්පත් වෙළෙඳ පොළ
    - වාණිජ පත්‍රිකා වෙළෙඳ පොළ
    - සාංගමික බැඳුම්කර (ණයකර) වෙළෙඳ පොළ
    - කොටස් වෙළෙඳ පොළ

මූල්‍ය උපකරණවල කල්පිරීමේ කාලය පදනම් කරගෙන මූල්‍ය වෙළෙඳ පොළ පහත පරිදි වර්ග කළ හැකි ය.

- මුදල් වෙළෙඳ පොළ
- ප්‍රාග්ධන වෙළෙඳ පොළ

ClassWork.LK

# මූල්‍ය වෙළෙඳපොළ සංයුතිය ගැලීම් සටහනකින්

මූල්‍ය වෙළෙඳ පොළ

- මුදල් වෙළෙඳ පොළ
  - අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳ පොළ
  - දේශීය-විදේශීය විනිමය වෙළෙඳ පොළ
  - භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළ
    - ප්‍රාථමික
    - ද්විතීයික
  - වාණිජ පත්‍රිකා වෙළෙඳ පොළ
- ප්‍රාග්ධන වෙළෙඳ පොළ
  - භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳ පොළ
  - සාංගමික බැඳුම්කර වෙළෙඳ පොළ
  - කොටස් වෙළෙඳ පොළ

ClassWork.LK

## ❖ මුදල් වෙළෙඳ පොළ

කෙටි කාලීන මූල්‍ය උපකරණ මිල දී ගැනීම හා විකිණීමට අදාළ වෙළෙඳ පොළ මුදල් වෙළෙඳ පොළ (Money Market) ලෙස හැඳින්විය හැකිය.

### • අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳ පොළ

වාණිජ බැංකු අතර කෙටිකාලීන ණය ඉල්ලුම් සහ ණය සැපයුම් සිදු වන වෙළෙඳ පොළ යි. ද්‍රවශලීතා හිඟයෙන් පෙළෙන බැංකු සිය ද්‍රවශීගතා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අතිරික්ත ද්‍රවශීලතාවක් සහිත වාණිජ බැංකුවලින් දින හතකින් හෝ ඊට අඩු කාලයකින් හෝ පියවීමට යටත් ව මුදල් ණයට ගැනීම ඒක්ෂණ ණය ගනුදෙනු ලෙස හැඳින්වෙන අතර එම ගනුදෙනු සිදු වන වෙළෙඳ පොළ **අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳ පොළ** ලෙස හැඳින්වේ.

ClassWork.LK

ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති එම බැංකු සතු සංචිත ගිණුම් හරහා මෙම ගනුදෙනු සිදු කරයි.

- **<u>දේශීය විදේශීය විනිමය වෙළෙඳ පොළ</u>**

රටෙහි විදේශ විනිමය යොදා ගෙන කෙටි කාලීන ණය ගැනීම හා කෙටි කාලීන ණය සැපයීම සිදු වන වෙළෙඳ පොළ යි.

නැතහොත් වාණිජ බැංකුවල විදේශ ව්‍යාවහාර මුදල් ගනුදෙනුවලට අදාළ ව සිදුවන කටයුතු මේ නමින් හැඳින්වේ.

අපනයනකරුවන් ලබා ගන්නා විදේශ මුදල් වාණිජ බැංකුවලට විකුණු ශ්‍රී ලංකා රුපියල් ලබා ගැනීම, ආනයනකරුවන් ශ්‍රී ලංකා රුපියල් ලබා දී විදේශ මුදල් මිල දී ගැනීම, ණයවර ලිපි නිකුත් කිරීම, විදේශ බැංකු අණකර නිකුත් කිරීම ආදි ගනුදෙනු මෙහි දී සිදු වේ.

ClassWork.LK

## • භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළ

රජයට අවශ්‍ය කෙටිකාලීන ණය දේශීය මුදලින් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මූල්‍ය උපකරණය භාණ්ඩාගාර බිල්පත් ලෙස හැඳින්වේ. මෙම භාණ්ඩාගාර බිල්පත් විකිණීම හා මිල දී ගැනීම සිදු වන වෙළෙඳ පොළ භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළ යි.

## භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළ වර්ගීකරණය

**1. භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළෙඳ පොළ**

ශ්‍රී ලංකා මහ බැංකුව  බිල්පත් ප්‍රාථමික වෙළෙඳ පොළ ලෙස සැලකේ.

ClassWork.LK

## 2. භාණ්ඩාගාර බිල්පත් ද්විතීයක වෙළෙඳ පොළ

ප්‍රාථමික වෙළෙඳ පොළෙන් මිලට ගත් භාණ්ඩාගාර බිල්පත් කල් පිරෙන තෙක් තබා නොගෙන භාණ්ඩාගාර බිල්පත් විකිණීම හා මිල දී ගැනීම සිදු වන වෙළෙඳ පොළ යි.

- <u>වාණිජ පත්‍රිකා වෙළෙඳ පොළ</u>

සමාගම් තම කෙටිකාලීන ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා නිකුත් කරනු ලබන පත්‍රිකා විශේෂය වාණිජ පත්‍රිකා ලෙස හැඳින්වේ. වාණිජ පත්‍රිකා විකිණීම හා මිලට ගැනීම සිදු වන වෙළෙඳ පොළ වාණිජ පත්‍රිකා වෙළෙඳ පොළ ලෙස හැඳින්වේ.

ClassWork.LK

## ❖ ප්‍රාග්ධන වෙළෙඳ පොළ

වර්ෂයකට වඩා වැඩි කාලයක දී කල් පිරෙන මූල්‍ය උපකරණ ගනුදෙනු සිදු වන වෙළෙඳ පොළ මේ නමින් හඳුන්වයි. එනම් දිගු කාලීන අරමුදල් අවශ්‍යතා ඇති පාර්ශ්ව හා දිගු කාලීන මුදල් අතිරික්තතා ඇති පාර්ශ්ව අතර ගනුදෙනු සිදු වන වෙළෙඳ පොළ ප්‍රාග්ධන වෙළෙඳ පොළ (Capital Market) ලෙස හඳුන්වයි.

- ## භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳ පොළ

රජයට අවශ්‍ය මධ්‍ය හා දිගු කාලීන ණය දේශීය මුදලින් ලබා ගැනීම සඳහා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන නිර්ලේඛන සුරැකුම්පත් විශේෂණය භාණ්ඩාගාර බැඳුම්කර ලෙස හැඳින්වේ. මේවා හුවමාරු වන වෙළෙඳ පොළ භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳ පොළ වේ.

ClassWork.LK

සුරක්ෂිත මූල්‍ය උපකරණයක් වන මෙය රුපියල් දස දහස් ගුණිතයන්ගෙන් යුක්ත ව මිල දී ගත හැකි ය. වසර දෙකේ සිට තිහක් තෙක් කල් පිරෙන සීමාවන්ගෙන් යුක්ත ව නිකුත් කරයි.

- **<u>සාංගමික බැඳුම්කර වෙළෙඳ පොළ</u>**

රාජ්‍ය සංස්ථා හා සීමිත පොදු සමාගම් විසින් මධ්‍ය හා දිගුකාලීන අරමුදල් සපයා ගැනීම සඳහා නිකුත් කරන බැඳුම්කර (ණයකර) අලෙවි කිරීම සම්බන්ධ කටයුතු සිදු කෙරෙනපවෙළෙඳ පොළ මෙය වේ. සාංගමික බැඳුම්කර කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තු ගත කර කොටස් වෙළෙඳ පොළේ හුවමාරු කිරීමට ද හැකිය.ාව ඇත.

- **<u>කොටස් වෙළෙඳ පොළ</u>**

ලැයිස්තුගත සමාගම් විසින් නිකුත් කරන කොටස් හා ණයකර ආදී සුරැකුම්පත් මිල දී ගැනීම හා විකිණීම සිදු කරන වෙළෙඳ පොළ කොටස් වෙළෙඳ පොළ වේ.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

# FINANCIAL MANAGEMENT (Part-VII)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# කොළඹ කොටස් හුවමාරුව

කොළඹ කොටස් හුවමාරුව ලැයිස්තුගත සමාගම්වල කොටස් මිල දී ගැනීම හා විකිණීම පරිපාලනය කරන ආයතනය කොළඹ කොටස් හුවමාරුව ලෙස හැඳින්වේ.

කොළඹ කොටස් හුවමාරුව ඇපයෙන් සීමිත සමාගමකි. එහි පූර්ණ සාමාජිකයන් ලෙස තැරැව්කාර සමාගම් ක්‍රියාත්මක වේ. මෙම තැරැව්කාර සමාගම් කොළඹ කොටස් හුවමාරුවේ අතරමැදියන් ලෙස කටයුතු කරයි.

කොළඹ කොටස් හුවමාරුවේ කාර්ය විධිමත් කිරීමේ හා අධීක්ෂණය කිරිම ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ. කොළඹ කොටස් හුවමාරුව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වැදගත් වීමට හේතු කීපයක් පහත දැක්වේ.

ClassWork.LK

# කොළඹ කොටස් හුවමාරුව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වැදගත් වීමට හේතු

- පුද්ගලයන් හා ආයතන ආයෝජනය සඳහා දිරිගැන්වීම.
- ආයෝජකයන්ට, කොළඹ කොටස් හුවමාරුව හරහා විවිධ ප්‍රතිලාභ ලබා ගත හැකි වීම.
- සමාගම්වලට විශාල ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි වීම.
- සමාගම්වල කොටස් සඳහා ද්විතීයක වෙළෙඳ පොළක් ඇති වීම.
- විදේශ ආයෝජකයන් රටට අද්දවා ගත හැකි වීම.

ClassWork.LK

- රජයේ සුරැකුම්පත් අලෙවි කිරිමෙන් රජයට අවශ්‍ය අරමුදල් ලබා ගත හැකි වීම.

- සමාගම්වල කොටස්වලට වටිනාකමක් නිර්මාණය වීම.

- සමාගම්වල කීර්තිනාමය හා ප්‍රතිරූපය ඉහළ යාම.

## ප්‍රාථමික වෙළෙඳ පොළ

කොටස් නිකුත් කරන සමාගමකින් ආයෝජකයින් විසින් සෘජුවම කොටස් මිලට ගැනීම ප්‍රාථමික වෙළෙඳ පොළ යි.

## ද්විතීයක වෙළෙඳ පොළ

කොළඹ කොටස් වෙළෙඳ පොළෙන් ආයෝජකයන් කොටස් මිල දී ගැනීම ද්විතීයක වෙළෙඳ පොළ යි.

ClassWork.LK

# සීමිත පොදු සමාගමකට කොළඹ කොටස් හුවමාරුවේ ලියාපදිංචි විය හැකි ආකාර

- **මූලික ප්‍රසිද්ධ නිකුතුවක් (Initial public offer) මඟින්**

සමාගමක් පළමු වරට කොටස් නිකුත් කිරීමක් මගින් මහජනයාට දායක වීමට ඇරියුම් කර කොටස වෙළෙඳ පොළේ ලැයිස්තුගත කිරීම.

- **විකුණුම් අර්පණයක් (offer for sale) මඟින්**

දැනටමත් කොටස් නිකුත් කර ඇති සමාගමක්, මහජනතාව සතුව ඇති කොටස් වෙළෙඳ පොළෙන් විකිණීමට ඉදිරිපත් කිරිම සඳහා ලැයිස්තු ගත කිරිම.

- **හඳුන්වා දීමක් (Introduction) මඟින්**

මහජනතාවට කොටස් නිකුත් කිරීමක් නොකර හඳුන්වාදෙන අවස්ථාවේදී ම කොළඹ කොටස් හුවමාරුව හරහා ම කොටස් නිකුත් කිරිම.

ClassWork.LK

# කොටස් වෙළෙඳ පොළ සමාගම් ලැයිස්තු ගත කිරීම

කොටස් වෙළෙඳ පොළේ සමාගම් ලැයිස්තු ගත කිරීමේ දී සියලු ම සමාගම් පුවරු 2ක් යටතේ ලැයිස්තුගත කිරීම සිදු කෙරේ.

1. ප්‍රධාන පුවරුව ( Board)Main Board)
2. දිරිසවි පුවරුව (Dirisavi )

## ප්‍රධාන පුවරුව

විශාල ප්‍රකාශිත ප්‍රාග්ධනයක් සහිත සමාගම් සඳහා වෙන් වූ පුවරුව ප්‍රධාන පුවරුව යි. ප්‍රධාන පුවරුවේ සාමාන්‍ය කොටස් ලැයිස්තු ගත වීම සඳහා සපුරා ලිය යුතු අවශ්‍යතා කීපයකි.

ClassWork.LK

## ප්‍රධාන පුවරුවේ සාමාන්‍ය කොටස් ලැයිස්තු ගත වීම සඳහා සපුරා ලිය යුතු අවශ්‍යතා

- සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 500ට නොඅඩු වීම.
- ලැයිස්තුගත වීමට ඉල්ලුම් කරන දිනට පෙර අවම වශයෙන් අඛණ්ඩ ව වසර 3ක් බදු පෙර ශුද්ධ ලාභ ලබා තිබීම.
- ව්‍යාපාරයේ පවතින ශුද්ධ වත්කම්, ලැයිස්තු ගත කිරීමට ඉලලුම් කළ දිනයේ සිට ආසන්න වර්ෂ දෙකක විගණනය කරන ලද මූල්‍ය වාර්තා මඟින් තහවුරු වීම. නිකුත් කර ඇති කොටස් ප්‍රමාණයෙන් අවම වශයෙන් 25%ක් මහජනයා සතු වීම.

ClassWork.LK

## දිරි සවි පුවරුව

සීමිත ප්‍රකාශිත ප්‍රාග්ධනයක් සහිත ව ආරම්භ වූ සමාගම් ලැයිස්තුගත කිරීමට වෙන්වූ පුවරුව දිරි සවි පුවරුව යි.

## දිරි සවි පුවරුවේ ලැයිස්තුගත වීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා

- සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් කෝටි 10ට නොඅඩු විය යුතු ය.
- නිකුත් කර ඇති කොටස් ප්‍රමාණයෙන් අවම වශයෙන් 10%ක් මහජනයා සතු විය යුතු ය.
- ව්‍යාපාරයේ පවතින ශුද්ධ වත්කම් ලැයිස්තුගත කිරීමට ඉල්ලුම් කළ දිනට, වසරක විගණනය කරන ලද මූල්‍ය වාර්තා මඟින් තහවුරු විය යුතු ය.
- සමාගමේ ක්‍රියාකාරි කාල සීමාව අවම වශයෙන් වසරක් වීම.

ClassWork.LK

# වොච් ලිස්ට් පුවරුව

කොටස් වෙළෙඳ පොළෙහි ලැයිස්තුගත කිරීමේ කොන්දේසි කඩ කරන හෝ නො පිළිපදින සමාගම් ඇතුළත් කරන පුවරුව වොච් ලිස්ට් පුවරුව ලෙස හැඳින්වේ. මෙය පෙර කඩ කළ පුවරුව ලෙස හඳුන්වා ඇත.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

# FINANCIAL MANAGEMENT (Part-VIII)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

## සුරැකුම්පත්

කොළඹ කොටස් හුවමාරුවෙහි ගනුදෙනු වන සුරැකුම්පත් කිහිපයක් පහත දැක්වේ.

- සාමාන්‍ය කොටස් - Ordinary Shares
- වරණීය කොටස් - Preference Shares
- කොටස් බලපත්‍ර - Share Warrants
- සාංගමික ණයකර - Corperate Debentrues
- රජයේ සුරැකුම්පත් -Government Debt Securities

## සාමාන්‍ය කොටස්

සාමාන්‍ය කොටස් මිල දී ගන්නා ආයෝජකයෝ එම සමාගමේ අයිතිකරුවෝ වෙති. මෙම කොටස් මිල දී ගන්නා ආයෝජකයන්ට සමාගම ලබන ලාභයෙන් යම් ප්‍රතිශතයක් හිමි වන නමුත් හිමි වන ලාභාංශය ස්ථිර නොවේ. එම නිසා අවදානම වැඩි ය. වාර්ෂික මහා සභා රැස්වීම්වලට සහභාගී වීමට අයිතිය හිමි වේ. පාලන බලතල හිමිවේ.

ClassWork.LK

## සාමාන්‍ය කොටස් වර්ග

1. ඡන්ද බලය සහිත සාමාන්‍ය කොටස් (Voting Shares)
2. ඡන්ද බලය රහිත සාමාන්‍ය කොටස් (Non-voting Shares)

❖ ඡන්ද බලය රහිත සාමාන්‍ය කොටස් හිමියන්ට ඡන්ද බලය හිමි නොවූවත් සාමාන්‍ය කොටස් වලට හිමි අනෙකුත් සියලු වරප්‍රසාද ලැබේ.

## වරණීය කොටස්

නිශ්චිත ලාභාංශ ප්‍රතිශතයක් හිමි සමාගම විසුරුවා හරින අවස්ථාවක දී ප්‍රාග්ධනය ආපසු ගෙවන විට ප්‍රමුඛත්වය හිමි වන කොටස් වරණීය කොටස් වේ. මෙම කොටස් හිමියන්ට සමාගමේ අයිතිය හිමි නො වේ. අවදානම අඩු ය. පාලන බලතල හිමි නො වේ.

ClassWork.LK

# කොටස් බලපත්‍ර

අනාගතයේ දී නිශ්චිත මිලකට සමාගමක කොටස් මිලට ගැනීමේ අයිතිය ලබා දෙමින් වර්තමානයේ සමාගම විසින් නිකුත් කරන ලියවිල්ල කොටස් බලපත්‍රය ලෙස හැඳින්විය හැකි ය.

කෙසේ වුව ද කොටස් ආයෝජනයෙන් ආයෝජකයකු ලබන ප්‍රාග්ධන ලාභ හැර අනෙකුත් ප්‍රතිලාභ ලැබීමට නම් කොටස් බලපත්‍රය කොටස් බවට පත් වන තුරු ළඟ තබා ගත යුතු ය.

ClassWork.LK

## සාංගමික ණයකර

සමාගමකට ණය ප්‍රාග්ධනය ලබා ගැනීම සඳහා සමාගමක් විසින් නිකුත් කරනු ලබන සුරැකුම්පත් විශේෂයකි. ලැයිස්තු ගත සමාගම් විසින් නිකුත් කරන ලැයිස්තුගත ණයකර කොටස් වෙළෙඳ පොළේ හුවමාරු කළ හැකි ය. ණයකරවල ආයෝජකයන්ට නිශ්චිත පොළී ප්‍රතිශතයක් හිමි වේ.

## රජයේ සුරැකුම්පත්

රජය විසින් නිකුත් කරන භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මින් අදහස් වේ. අවදානම ඉතා අවම ආයෝජන ලෙස මේවා සැලකේ. භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන පොළී අනුපාත ස්ථාවර නො වන අතර රජය කලින් කලට විවිධ පොළී අනුපාතයන් යටතේ මේවා නිකුත් කරනු දැකිය හැකි ය.

ClassWork.LK

# කොටස් වෙළෙඳ පොළේ හුවමාරු වන සුරැකුම්පත් වල ආයෝජනයෙන් ලැබෙන සෘජු හා වක්‍ර ප්‍රතිලාභ

## සෘජු ප්‍රතිලාභ

- **ලාභාංශ**

සමාගමක් තම ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමෙන් උපයන ශුද්ධ ලාභයෙන් සමාගමේ කොටස් හිමියන්ට බෙදා හරින ප්‍රමාණය ලාභාංශ වේ. සමාගම් සාමාන්‍යයෙන් ලාභාංශ මූල්‍යමය ආකාරයෙන් හෝ කොටස් ආකාරයෙන් හෝ ප්‍රකාශයට පත් කරනු ලබයි.

ලාභාංශ මූල්‍යමය වශයෙන් ප්‍රකාශයට පත් කිරීමේ දී කොටසකට මුදල්මය අගයක් ලෙෂ ප්‍රකාශ කෙරේ. එනම්, කොටසකට නිශ්චිත මුදල් ප්‍රමාණයක් ලෙස ප්‍රකාශයට පත් කෙරේ.

**නිදසුන්** : කොටසකට රු. 2.50ක් ආදි වශයෙන් .

ClassWork LK

- **පොළී**

ලැයිස්තුගත සමාගම් විසින් නිකුත් කරනු ලබන සාංගමික ණයකර මිල දී ගන්නා ආයෝජකයන්ට සමාගම විසින් වාර්ෂික ව පොළියක් ගෙවනු ලබයි. ණයකර සඳහා ගෙවනු ලබන්නේ නිශ්චිත පොළියක් වන අතර එය ණයකර නිකුත් කිරීමේ දී ම ප්‍රකාශ කරනු ලැබේ.

- **සංචිත ප්‍රාග්ධනීකරණය**

සමාගම සතු ව පවතින සංචිත කොටස් ප්‍රාග්ධනය බවට පත් කිරීම මෙහි දී සිදු වේ. මේ මගින් කොටස් හිමියන්ට අනුපාතයකට නව කොටස් ලැබීමක් සිදු වේ. සංචිත ප්‍රාග්ධනීකරණයේ දී සමාගමෙහි ප්‍රකාශ කළ ප්‍රාග්ධනය වැඩි වීමක් සිදු වේ. මෙම සංචිත ප්‍රාග්ධනීකරණ ක්‍රියාවලිය සඳහා කොළඹ කොටස් වෙළෙඳ පොළෙහි පූර්ණ අනුමතිය ලබා ගත යුතු ය.

ClassWork.LK

- **හිමිකම් නිකුතුව**

හිමිකම් නිකුතුවක් යනු සමාගමේ දැනට සිටින සාමාන්‍ය කොටස් හිමියන්ට කිසියම් අනුපාතයකට අනුව කොටස් නැවත ලබා දීම යි. හිමිකම් නිකුතුවක දී වෙළෙඳ පොළේ මිලට වඩා අඩු මිලකට කොටස් ලබා ගැනීමේ අවස්ථාව ආයෝජකයන්ට ලැබේ.

මෙසේ අඩු මිලකට කොටස් හිමි කර ගැනීමට හා එම හිමිකම වැඩි මිලකට විකුණා ලාභ අත් කර ගැනීමට හෝ ආයෝජකයාට අවස්ථා ලැබීම හිමිකම් නිකුතුවක ප්‍රතිලාභය යි.

ClassWork.LK

- **ප්‍රාග්ධන ලාභ**

කිසියම් ආයෝජකයකු ගැනුම් මිලට වඩා වැඩි මිලට කොටස් විකුණුවේ නම් එමගින් ඔහු ලබන්නේ ප්‍රාග්ධන ලාභයකි. නිදසුනක් ලෙස කොටස් රු. 30ට මිලදී ගත් පුද්ගලයකු කොටසක් රු. 50කට විකුණාන ලද්දේ නම් ඔහුට කොටසකින් රු. 20ක ප්‍රාග්ධන ලාභයක් හිමි වේ.

කොටස් වෙළෙඳ පොළ තුළ ගනුදෙනු කරන ආයෝජකයන්ට ලැබිය හැකි ආකර්ෂණීය ප්‍රතිලාභය මෙම ප්‍රාග්ධන ලාභය යි.

## වක්‍ර ප්‍රතිලාභ

- සමාගමක සාමාන්‍ය කොටස් හිමියන්ට ඡන්ද බලය හිමි වීම හා අධ්‍යක්ෂවරයකු ලෙෂ පත් විය හැකි වීම.

- රජයේ සුරැකුම්පත් මිල දී ගත් පුද්ගලයන්ට එය ලබා ගැනීමේ දී ඇප සුරැකුම් ලෙෂ භාවිත කළ හැකි වීම.

- රජයේ සුරැකුම්පත්වල කරන ආයෝජනයේ අවදානම ඉතා අඩු මට්ටමක පැවතීම හා ඉහළ ද්‍රවශීලතාවක් පැවතීම.

- කොටස් විකිණීමෙන් හිමි වන ප්‍රාග්ධන ලාභ බදුවලින් නිදහස් වීම.

- කොටස් අවශ්‍ය විටක කොටස් වෙළෙඳ පොළේ විකිණීමට හැකිවීම නිසා ඉක්මනින් මුදල් බවට පත් කර ගත හැකි වීම හා කොටස් ඉහළ ද්‍රවශීලතාවකින් යුතු වීම.

- ප්‍රසාද නිකුතුවලට හිමිකම් ලැබීම.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

# FINANCIAL MANAGEMENT (Part-IX)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

කොටස් වෙළෙඳ පොළක ගනුදෙනු ක්‍රියාකාරී ද, නැත්ද යන්න විග්‍රහ කිරිම සඳහා පොදු සංඛ්‍යා දර්ශක රැසක් ලෝකයේ භාවිත වන අතර ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳ පොළේ කාර්යසාධනය මැනීම සඳහා පහත මිල දර්ශක යොදා ගනී.

## කොටස් වෙළෙඳ පොළේ කාර්යසාධනය මැනීම සඳහා යොදා ගන්නා මිල දර්ශක

- සියලු කොටස් මිල දර්ශකය (ASPI) All Share Price Index
- S & P ශ්‍රී ලංකා 20 දර්ශකය S & P SL 20 Index
- මුළු ප්‍රතිලාභ දර්ශකය (TRI) Total Return Index

ClassWork.LK

# සියලු කොටස් මිල දර්ශකය

කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කළ සමාගම් සියල්ලේ ම ඡන්ද බලය හිමි සාමාන්‍ය කොටස්වල මිල ගණන්හි ඇති වන උච්චාවචන පෙන්නුම් කරන දර්ශකය සියලු කොටස් මිල දර්ශකය යි. මෙම දර්ශකය සඳහා සැකසීමේ දී 1985 වසර පාදක වර්ෂය ලෙස යොදා ගන්නා අතර, පාදක දර්ශක අගය 100 ලෙස යොදා ගනී.

සියලු කොටස් මිල දර්ශකය පහත පරිදි ගණනය කරයි.

$$\text{සියලු කොටස් මිල දර්ශකය} = \frac{\text{සියලු ලැයිස්තුගත සමාගම්වල වර්තමාන වෙළඳ පොළ ප්‍රාග්ධනීකරණය}}{\text{තෝරාගත් සමාගම් 20 හි පාදක දිනයේ වෙළෙඳ පොළ ප්‍රාග්ධනීකරණය}} \times 100$$

ClassWork.LK

❖ ඉහත දර්ශකවලට අමතර ව මුළු ප්‍රතිලාභ දර්ශක ද දෛනික ව සකස් කරයි. මෙය 2004 වර්ෂයේ හඳුන්වා දුන් අතර මෙය කොටස් මිල වෙනස් වීම සහ ලාභාලාභ ආදායම යන සාදක දෙක ම සැලකිල්ලට ගනිමින් සකස් කරයි.

❖ සියලු කොටස් මිල දර්ශකය මුළු ප්‍රතිලාභ යන පදනම යටතේ ගණනය කළ විට සියලු කොටස් මුළු ප්‍රතිලාභ දර්ශකය - ( ASTRI ) ලෙස ද S & P ශ්‍රී ලංකා 20 මිල දර්ශකය මුළු ප්‍රතිලාභ යටතේගණනය කළ විට S & P ශ්‍රී ලංකා 20 මුළු ප්‍රතිලාභ දර්ශකය ( S & PTRI ) ලෙස ද හඳුන්වයි.

ClassWork.LK

## කොටස් වෙළෙඳ පොළ මිල දර්ශකවල වැදගත්ම

- ආර්ථික ක්‍රියාකාරිත්වය පිළිබඳ ව යම් අවබෝධයක් ලැබිය හැකි වීම.
- ආර්ථිකයෙහි සමාගම්වල ක්‍රියාකාරිත්වය පිළිබඳ ව යම් අවබෝධයක් ලැබිය හැකි වීම.
- වෙනත් රටවල කොටස් වෙළෙඳ පොළ තත්ත්වයන් සමග සංසන්දනය කළ හැකි වීම.
- ආයෝජන තීරණ ගැනීමේ දී ආධාර කර ගත හැකි වීම.

❖ කොටස් වෙළෙඳ පොළ මිල දර්ශක කාලීන ව වෙනස් විය හැකි අතර එම මිල දර්ශක ගණනය කරන ආකාරය ද වෙනස් විය හැකි බැවින් කාලීන තොරතුරු ගැන ද සැලකලිමත් වන්න

Class Work.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."